# රැකියාවේ නිරත පුද්ගලයන්ගේ මානසික ආතතිය (Stress) කෙරෙහි මානව වැඩ චර්යාව (Human work behaviour) බලපානු ලබන ආකාරය පිළිබඳව සමාජ මනෝ විද්‍යාත්මක විග්‍රහයක්
## (ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයට අයත් බියගම අපනයන සැකසුම් කලාපයේ පිහිටා ඇති පෞද්ගලික ආයතන ද්විත්වයක් ආශ්‍රයෙන්)

ටී.එම්.කේ.එල්.සී තෙන්නකෝන්
klankika1992@gmail.com

''රැකියාවේ නිරත පුද්ගලයන්ගේ මානසික ආතතිය (Stress) කෙරෙහි මානව වැඩ චර්යාව (Human work behaviour) බලපානු ලබන ආකාරය පිළිබඳව සමාජ මනෝ විද්‍යාත්මක විග්‍රහයක්'' යන පර්යේෂණ මාතෘකාව මූලික කොටගෙන මෙම පර්යේෂණය සිදුකොට ඇත. නූතන ශ්‍රී ලංකාවේ කාර්යබහුල සමාජය තුළ මිනිසාට තම ජීවිතයේ සතුට, සැනසුම, තම පවුල් ජීවිතය පිළිබඳව හෝ තමාගේ ශරීර සෞඛ්‍යය, මානසික සෞඛ්‍යය පිළිබඳව පවා සිතීමට ඉඩකඩක් නොමැති තත්ත්වයක් පෙන්නුම් කරන බව දෘශ්‍යමාන වේ. ආයතනික වශයෙන් ගත් කළ ආයතනයක සාර්ථකත්වය නිතැතින්ම රඳා පැවතීමට ආයතකින මානව සම්පතෙහි යහපත් මානසිකත්වය ඉතා වැදගත් වේ. මන්දයත් ඒ මත ඔවුන්ගේ වැඩ චර්යාව, පුද්ගල සාර්ථකත්වය මෙන්ම ආයතනික අභිවෘද්ධිය ද රඳා පවතින හෙයිනි.
උක්ත මාතෘකාව මූලික කොට ගෙන පර්යේෂණය සිදු කිරීම සඳහා නියැදිය වශයෙන් ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයට අයත් බියගම අපනයන සැකසුම් කලාපයේ පිහිටා ඇති ප්‍රමුඛ ගණයේ පෞද්ගලික ආයතන වන මයිඩාස් සේෆ්ටි (Midas safety) සහ එම්.ඒ.එස් ඇක්ටිව් (MAS Active) යන ආයතන ද්විත්වය යොදා ගෙන ඇත. එක් ආයතනයකින් සේවකයන් සියයට පහක් (5%) නියැදියට අදාළ වන ආකාරයට ආයතන ද්විත්වයෙන් ශ්‍රමිකයින් (Human Workes) 100 දෙනෙකුගෙන් යුතු සසම්භාවී නියැදියක් (Random Sample) මෙම පර්යේෂණය සඳහා තෝරා ගන්නා ලදී. එම පදනමේ සිට ආයතනයේ විවිධ අංශයන්හි නියෝජනයක් නියැදියට යොදා ගැනීම සඳහා ස්ථර සසම්භාවී නියැදුම් ක්‍රමය යටතේ පසු ස්ථරීකරණ නියැදි ක්‍රමය (Post-Stratification Sample) භාවිතා කොට ඇත. ප්‍රශ්නාවලී, සම්මුඛ සාකච්ඡා, නිරීක්ෂණය, කේන්ද්‍රීය සම්මුඛ සාකච්ඡා (FGD) ආදී වූ පර්යේෂණ ක්‍රම ශිල්පයන් යොදා ගනිමින් දත්ත දායකයින් ගෙන් ලබා ගත් දත්ත SPSS, Excel මෘදුකාංග භාවිතා කරමින් විශ්ලේෂණාත්මකව ඉදිරිපත් කොට ඇත.
සමස්තයක් ලෙස ගත් කළ, අන්තර් පුද්ගල සබඳතා, පුද්ගල පෞරුෂය, ආර්ථික දේශපාලන පාරිසරික සමාජානුයෝජනය, පුද්ගල යහ පැවැත්ම, හැකියා පූර්ණත්වය, කාර්යක්ෂමතාවය, සේවක අභිප්‍රේරණය, සේවක තෘප්තිය, බලය, ආත්ම සාක්ෂාත්කරණය ආදී වූ සියල්ලේ යම් යම් විහීනතාවයන් හරහා රැකියා ක්ලමථය ඇති වීමට රැකියාමය අභ්‍යන්තර බාහිර සාධක මෙන්ම රැකියාවෙන් පරිබාහිර වෙනත් සාධකයන් ද බලපාන බවට දත්ත විශ්ලේෂණයේ දී මෙන්ම ශ්‍රමික අදහස් ඔස්සේ ද පෙනී ගිය බව දැක්විය යුතුය.

**ප්‍රමුඛ පද** ඃ රැකියා ක්ලමථය; මානව වැඩ චර්යාව; වැඩ පරිසරය